# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

**2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික 1 පරීක්ෂණය**
**ප්‍රථම වසර**
**2017/2018 Academic Year - Semester 1 Examination**
**First Year**

## මූලාශ්‍ර ග්‍රන්ථ පරිචය – PBUS 11013

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

---

01. (අ) පහත දැක්වෙන පාලි ගද්‍ය කොටස සිංහලට නගන්න.

තෙන හි භන්තෙ ථෙරො භික්ඛූ උච්චිනතූති අථ ඛො ආයස්මා මහාකස්සපො එකෙනූනානි පඤ්ච අරහන්තසතානි උච්චිනි. භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං: අයං භන්තෙ ආයස්මා ආනන්දො කිඤ්චාපි සෙඛො අභබ්බො ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං. බහූ ච අනෙන භගවතො සන්තිකෙ ධම්මො ච විනයො ච පරියත්තො. තෙන හි භන්තෙ ථෙරො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනතූති.

(ලකුණු 05)

(ආ) පහත දැක්වෙන පාලි ගද්‍ය කොටස සිංහලට නගන්න.

සචෙ විහාරො ඔවස්සති සචෙ උස්සහති ඡාදෙතබ්බො. උස්සුක්කං වා කාතබ්බං කින්ති නු ඛො විහාරො ඡාදීයෙථාති. එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසල. නො චෙ ලභෙථ යො දෙසො අනොවස්සකො හොති, තත්ථ චතුසු පාසාණෙසු මඤ්චං පඤ්ඤපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරි පුඤ්ජං කරිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා පක්කමිතබ්බං.

(ලකුණු 05)

(ඉ) පහත දැක්වෙන සෙල්ලිපි පාඨ වත්මන් සිංහල ව්‍යවහාරික භාෂාවට පරිවර්තනය කරන්න.

I. තිශ තෙරශ දනෙ ශගශ
තිශ තෙරහ දනෙ අගත අනගත චතුදිශ ශගශ
II. බමණ උතර පුසගුතහ ලෙණෙ
III. පරුමක අනුඩි පුත පරුමක තිශහ දනෙ ශගශ
බඩකරික මඣිමක ලෙණෙ ශගශ
IV. බත සිව ගුතහ ලෙණෙ චතු දිශ ශගශ දිනෙ
V. පරුමක (ශො) නහ ලෙණෙ ශගශ

(ලකුණු 05)

(ඊ) පහත දැක්වෙන සිංහල පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

| | |
|---|---|
| තියුණු නැණින් කෙරෙමින් සැක | නිවාරණ |
| පමුණු වමින් එකිනෙක සමය | කාරණ |
| දැමුණු සිතින් ඉඳ කර වෙහෙර | පූරණ |
| බමුණු රැසෙක් වෙද'රුත් කෙරෙති | දාරණ |
| | |
| ස බා තුරු ලෙසින් බොල්ලන් ගෙන | නො මඳ |
| ත බා පෙළින් පෙළ ඇඳූ තිල් පලග | මැද |
| බ බා සෙද තැනින් තැන ගහ ගණන් | බැඳ |
| ප බා කර සිදත් සමහරු ගණිති | ඉඳ |

(ලකුණු 05)

2. ධර්මය ඉගෙනීමේදී පාලි ත්‍රිපිටක මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම පහදන්න.
(ලකුණු 20)

3. බෞද්ධ ආරාමවල ආරම්භය හා විකාශය සෙනාසනක්ඛන්ධකය ඇසුරෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 20)

4. අට්ඨකථාවලින් හෙළිවන ලක්දිව ඓතිහාසික තොරතුරු පිළිබඳව විමසීමක් කරන්න.
(ලකුණු 20)

5. ප්‍රථම ධර්ම සංගීතිය පිළිබඳ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේදී ''පඤ්චසතිකක්ඛන්ධකයෙහි'' ඇති වැදගත්කම පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(ලකුණු 20)

6. පැරණි ශ්‍රී ලංකාවේ ආරාමික ජීවන තොරතුරු ශිලාලේඛන ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 20)